# තනතුරු පුරප්පාඩු

**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ස්ථානභාර නිලධාරී තනතුර

**සඳහා ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## ස්ථානභාර නිලධාරී

**වැටුප් පරිමාණය :**

MA 1-1-2006A - RS: 13,450/-,10X145/-,07X170/-,04X240/-,20X320/- - 23,450/-

MA 1-1-2016 - RS: 27,910/-,10X300/-,07X350/-,04X495/-,20X660/- - 48,540/-

**මූලික අධ්‍යාපන සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව යන විෂයන් ඇතුළුව විෂයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය, සහ ශිල්පීය සේවා ගණයෙහි සේවයේ නියුතු වූවන් විසින් ඉහත (අ) හි සඳහන් සුදුසුකම්

හා

පහත (ඇ) (ආ) සහ (ඉ) සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ඇ) පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන්.

(ආ) සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටතේ පිරිසෙයින් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :**

2017-06-12 දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් :**

i. සෑම ඉල්ලුම්කරුවෙක්ම, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

පත්වීම් බලධාරියා විසින් පත්කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීමේ පටිපාටියට අනුව බඳවාගනු ලැබේ.

සේවක අර්ථ සාධක අරමුදලට පත්වීම්ලාභීන් 8% ක්ද, සේවා යෝජකයාගෙන් 12% වශයෙන් දායක මුදල් ගෙවිය යුතුය. ඊට අමතරව සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට පත්වීම්ලාභියාගේ වැටුපෙන් 3% ට සමාන මුදලක් ගෙවනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය අදාළ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. අයදුම්කරුන්ගේ සම්පූර්ණ ජීවදත්ත සහ අදාළ සහතිකවල, සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය. සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තමා විසින් පිළියෙල කරගත් අයදුම්පත් සභාපති, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, 08 වන මහල, අංක 464 ගොඩනැගිල්ල, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට 2017-06-12 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඔබගේ දුරකථන අංකය හා ඔබ ගැන විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ ලිපිනයන් සහ දුරකථන අංකයන් අයදුම්පතෙහි සඳහන් කර තිබිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ කෙළවරේ, ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තැපෑලෙන් අස්ථානගතවන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳ අප සංස්ථාව වගකියනු නොලැබේ.

**සභාපති,**

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව,**

**08 වන මහල,**

**අංක 464, ගොඩනැගිල්ල, ටී.බී. ජයා මාවත, කොළඹ 10.**

**දු.ක.අ. 0112-689735**